# 26

# මානව අයිතිවාසිකම්

ඉස්ලාම් මිනිස් ජීවිතයේ සියලු අංශවලට මග පෙන්වන ආගමකි. ඒ තුළින් මිනිසාගේ පෞද්ගලික, පවුල්, සමාජ ජීවිතයේ යහපත පිළිබඳ සියලු අංශවලට අවශ්‍ය නීති රීති සම්පාදනය වී ඇත.

මිනිසා මිනිසකු ලෙස ජීවත් වීමට වගකීම් අවශ්‍ය වනවා සේ ම අයිතිවාසිකම් ද අවශ්‍ය ය. අල්ලාහ්ගේ විශේෂිත මැවීමක් වන නිසා සියලු මිනිසුන් එක සමාන අයිති වාසිකම් ඇත්තෝ වෙති. කුමන කාලයක කුමන පරිසරයක ජීවත් වන කෙනෙකු වුව ද ඔහුගේ රට, ජාතිය, දේශපාලනය, සමාජ ආර්ථික අධ්‍යාපනික පසුබිම කුමක් වුව ද ආර්ථික ක්‍රමය කුමක් වුව වගකීම් සහ අයිතිවාසිකම් සියලු දෙනාටම පොදු වේ. ඒවා ලබා දෙන්නේ සර්වබලධාරියා වන අල්ලාහ් විසිනි. මක් නිසා ද යත් සියලු දෙනාට ම පොදුවේ සමානාත්මතාවයෙන්,අපක්ෂපාතීව වගකීම් සහ අයිතිවාසිකම් පෙන්වා දිය හැක්කේ.(ඔහුට පමණි)

එම නිසා ඉස්ලාම් මානව අයිතිවාසිකම් අල් කුර්ආනය සහ සුන්නාව තුළින් ලබා ගන්නේ ය. අල්ලාහ් මිනිසාට අයිතිවාසිකම් ලබා දෙන්නේ උපතේ දීම ය. එම නිසා කිසිවෙකුට එය කිසිවකුට වැලැක්විය නොහැක, පැහැර ගත නොහැක, දූෂණය කළ නොහැක, එසේ කිරීමට සිතන අය මහත් ද්‍රෝහියෝ වෙති. තව ද ඔවුහු අල්ලහ්ගේ දඬුවමට ලක් වෙති.



අල්ලාහ් ලබා දුන් අයිතිවාසිකම් මිනිසා සකස් කළ අයිතිවාසිකම් මෙන් බල රහිත ඒවා නොවේ. මිනිසා සකස් කළ අයිතීන් කලින් කලට ස්ථානයෙන් ස්ථානයට වෙනස් වෙයි. ලබා දෙන පෙන්වමින් උදුරා ගනු ලබන, එසේම ලේඛනයකට පමණක් සීමා වූ, ක්‍රියාවට නොනැගෙන (රාජ්‍ය බලයෙන් හෝ වෙනයම් ක්‍රමයකට අවලංගු වන) ඒවා වේ. මෙම ක්‍රියා නිසා මිනිස් සමාජය අපහසුතාවට පත් වෙයි. එක්තරා කාලයක එක් ප්‍රදේශයක ජීවත් වන ජනතාව භුක්ති විඳින දේ අන් ජනතාවට හෝ ප්‍රදේශයට අහිමි වෙයි.

නවීන ලෝකය ලබා දුන් අයිතීන් තුළ මෙවැනි විවිධ අඩු පාඩු දක්නට ලැබේ. මේවා සකස් කළ බටහිර ලෝකය ඒ පිළිබඳ මූලික කතිකාවතක් ගොඩනැගීමට සියවස් හයකට පෙර ඉස්ලාමය මානව අයිතිවාසිකම් ප්‍රකාශයට පත් කොට ඇත.

නබි (සල්) තුමා මදීනාවට හිජ්රත් ගිය අලුත එහි ජීවත් වූ ජනතාව සමග ගිවිසුමකට එළඹුණේ ය. මෙය මදීනා සම්මුතිය නමින් හැඳින්වේ.

මෙයට සියවස් හයකට පසු ක්‍රි. ව 1215 දී මහා සම්මුතිය, "සුමක්නා කාට්ටා", යන නමින් එංගලන්තයේ සාර් රජතුමා සහ ජනතාව අතර ගිවිසුමක් තිබුණි. පසු කාලීන ව එය විවිධ සංශෝධනයන්ට ලක් විය.

එනමුත් ඉස්ලාම් ඉදිරිපත් කළ අයිතීන් ස්ථිරවර විය. මිනිස් ක්‍රියාකාරකම්වලට යෝග්‍යය විය. නොකඩා ක්‍රියාත්මක වීම, කාහටවත් උදුරා ගැනීමට නොහැකි වීම වැනි ගුණාංග ඇතුළත් විය. මේවා ලබා දීමට එරෙහි වන්නේ නම් එය පවක් වන අතර නීති විරෝධී හා දඬුවම් ලැබිය හැකි වරදක් ද වේ.

මේ ගැන නීතිපති ආචාර්ය සී. වී වීරමන්ත්‍රි මහතා අතින් රචිත "ඉස්ලාමීය නීතිය හා ජාත්‍යන්තර දැක්ම" යන ග්‍රන්ථයේ අලුත් දෘෂ්ටි කෝණයකින් විස්තර කෙරෙයි. වත්මන් ජාත්‍යන්තර සම්මුතින් කිසිවක් ගැන නොසලකා ඉස්ලාමීය නීතිය පමණක් විමර්ශනය කර ඒවායේ අන්තර්ගත මානව අයිතිවාසිකම් පිළිබඳ නීති රීති හා කරුණු උපුටා ගැනීමෙන් ම පමණක් වුව ද "ජාත්‍යන්තර ඉස්ලාමීය මානව අයිතිවාසිකම්" ලෙස සම්මුතියක් සකස් කළ හැකි ය. මෙවැනි සම්මුතියක් සකස් කිරීමෙන් වත්මන් මානව අයිතිවාසිකම් ප්‍රඥප්තීන් හා ඉස්ලාමීය මානව අයිතිවාසිකම් අතර සමාන කම් ඇති බව පසක් වනු ඇත.

## ඉස්ලාම් පිළිගැන්වූ මානව අයිතිවාසිකම් කිහිපයක්

### 01. ජීවත් වීමේ අයිතිය

මනුෂ්‍ය ප්‍රාණය ඉතා අගනේ ය. එය ආරක්ෂා කළ යුතුය. එම නිසා සෑම කෙනෙකුම කිසි ම බාධාවකින් තොර ව ජීවත් වීමේ අයිතිය ලබා සිටියි.

අල්ලාහ් උතුම් කළ ප්‍රාණය නිසි විභාගයකින් තොර ව මරන්න එපා" (6:151) යනුවෙන් ද

"කවරෙක් (අසාධාරණ ලෙස) ප්‍රාණ ඝාතනය කළේ ද ඔහු සියලු ම මිනිසුන් ඝාතනය කළා හා සමාන ය. එසේම කෙනෙක් යම් ප්‍රාණයක් ජීවත් කළේ ද ඔහු සියලු ම මිනිසුන් ජීවත් කළා හා සමානයි" (5:32) යැයි අල්කුර්ආන් පවසයි.

**02. සමානාත්මතා අයිතිය**

සියලු මිනිසුන් නීතිය ඉදිරියේ සමාන වේ. ජාතිය, ස්ථානය, පාට, හැඩරුව වැනි දෙයින් වෙන් කළ නොහැකි ය.

'මිනිසුනි, ඔබගේ දෙවියා ඒකයෙකි. දන ගන්න අරාබිවරුන් අරාබි නොවන අයට වඩා ද සුදු ජාතීන් කළු ජාතීන්ට වඩා ද උසස් අය නොවේ. දේව බිය බැතිය තුළින් පමණක් ඔබලා උසස් පුද්ගලයින් ලෙස සලකනු ලැබේ' යැයි නබි (සල්) තුමා පැවසුවේ ය.

**03. පෞද්ගලික නිදහසේ අයිතිය**

"වර්ග තුනක් වන මිනිසුන්ට විරුද්ධ ව මම කියාමා දිනයේ වාද කරමි. ඉන් එක් පිරිසක් මිනිසුන් වහලුන් බවට පත් කර ඔවුන් විකුණා එම මුදලින් ජීවත් වන අය," (බුහාරි) ඉස්ලාම්, වහල් භාවයෙන් මිනිසුන් මිද වීමට නිදහස් කිරීම ට) පොළඹවීම් කරයි.

'ඉස්ලාමය තුළ බල කිරීම් නැත, මක්නිසාද යත් නොමග සිට යහමග අනාවරණය විය' (2:256) යනුවෙන්
අල් කුර්ආනයේ සඳහන් වීම මිනිසකුට තමා කැමති ආගමක් ඇදහිය හැකි ආගමික නිදහස පිළිබඳ ව ඇති නිදසුනකි.

**04. නීතියේ පිහිට ලබා ගැනීමේ අයිතිය**

සෑම මිනිසකුට ම නීතිය ඉදිරියේ සමාන සැලැකුම් ලැබීමටත් සාධාරණය ඉටු කර ගැනීමටත් අයිතිය ඇත.

'විශ්වාසවන්තයිනි අල්ලාහ් වෙනුවෙන් (සාධාරණව) සත්‍යය සාක්ෂි පවසන පුද්ගලයින් ම වන්න, එක් පාර්ශවයකට ඔබේ ඇති වෛරය නිසා ඔවුන්ට අසාධාරණයක් කිරීමට ඔබව පොළඹවීමක් නොසිදු විය යුතුය.(කොපමණ ක්‍රෝධය/වෛරය තිබුණ ද) නීතිය ක්‍රියාත්මක කරන්න. එය පාරිශුද්ධත්වයට ඉතා ආසන්න වූ තත්ත්වයකි. (5:8)

'මගේ දියණිය ෆාතිමා සොරකම් කළත් ඇගේ අත කැපීමට පසුබට වෙන්නේ නැත,' යනුවෙන් නබි (සල්) තුමා පවසා ඇත.

**05. ගෞරවය ආරක්ෂා කරගැනීමේ අයිතිය.**

සියලු දෙනාට ම තමන්ගේ තත්ත්වය හා ගෞරවය හානි වන ක්‍රියා මෙන් ම පදනම් විරහිත චෝදනාවලින් ආරක්ෂා වීමේ අයිතිය අල් කුර්ආනය තරයේ ප්‍රකාශ කර තිබේ.

'විශ්වාසවන්තයිනි ! බොහෝ සැකවලින් ඔබ දුරස් වන්න. ඇයි නම් සැක ඒවා සෙමහක් පව් පිරෙන ක්‍රියාවන් ය. කාගේ හෝ වරදක් ඔබ පුලපුලා විභාග කරන්න එපා. කේලම් කියන්න එපා.' (49:12)

**06. දේපළ ආරක්‍ෂා කිරීමේ අයිතිය.**

සෑම පුද්ගලයකුටම ජීවිතයේ මූලික අවශ්‍යතා ලබා ගැනීමේ අයිතිය ලබා දී ඇත.

පිරිමින් රැස් කළ දේ පිරිමින්ට අයිති ය. එමෙන් ම ස්ත්‍රීන් රැස් කළ දේ ස්ත්‍රීන්ට හිමි වේ. (4:32)

**07. ආගමික හැඟීම් වලට ආරක්‍ෂාව ලබා දීමේ අයිතිය.**

'විශ්වාසවන්තයිනි ! අල්ලාහ් නොවන කුමක් ඔවුන් (දෙවියන් යැයි) පිළිගන්නේ ද ඒවාට ඔබ බණින්න එපා. එයින් ඔවුන් නොදැනුවත් කමින් අසීමිත ලෙස අල්ලාහ්ට බැන වදීවී. මෙසේ සියලු වර්ගවලට අදාළ පිරිසට ඔවුන්ගේ කාර්යය/ අලංකෘත කොට ඇත්තෙමු. පසුව ඔවුන් තම දෙවියන් වෙතම යන්නෝ ය. ඔවුන් කළ දේ පිළිබඳ ව ඔහු ඔවුන්ට පහදා දෙනු ඇත."(6:102)

මෙහි දී ඉස්ලාම් ලබා දී ඇති මානව අයිතිවාසිකම් කිහිපයක් පමණක් හඳුනා ගත්තෙමු. ඉස්ලාමයේ මානව අයිතිවාසිකම් යන කොටස ඉතා පුළුල් වේ. තනි මිනිසාගේ සිට සමාජ ජීවිතයේ සියලුම අංශ පිළිබඳ අන්තර්ගත කොට ඒවා විග්‍රහ කර ඇත. මේ පිළිබඳ ඉහළ ශ්‍රේණිවල දී ඔබට ඉගෙන ගත හැකි ය.

**අභ්‍යාස**

01. වගකීම, අයිතිවාසිකම යන දෙක වෙන් කර පෙන්වන්න.

02. මානව අයිතිවාසිකම් අල්ලාහ් විසින් සකස් කොට තිබීමට හේතු දක්වන්න.

03. මිනිසා විසින් සකසන ලද අයිතීන් දුබල වන්නේ ඇයි ?

04. මානව අයිතිවාසිකම් දෙකක් සඳහන් කර ඒවායේ ලක්‍ෂණ පිළිබඳ සඳහන් කරන්න.

05. ඉස්ලාම් පෙන්වා දී ඇති මානව අයිතිවාසිකම් දෙකක් සඳහන් කර ඒවායේ වැදගත්කම පැහැදිලි කරන්න.